ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2013 මැයි මස 6 වැනි දින |

## 2013 පෙබරවාරි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික සහ කාර්මික යන දෙඅංශයේම අපනයන පහත වැටීම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී 2013 පෙබරවාරි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 798 දක්වා සියයට 2.9 කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන් රබර් සහ පොල් අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍යයන්ගේ අපනයන ආදායම පහත වැටුණි. දියමන්ති, ස්වර්ණාභරණ, ඛනිජ නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර ඇතුළු අයිතම කිහිපයක අඩු අපනයන ආදායම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පහත වැටුණි. එසේ වුවත්, ආසන්න වශයෙන් මුළු අපනයන සඳහා සියයට 40 ක පමණ සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී 2013 පෙබරවාරි මාසයේ දී සියයට 8.8 කින් වර්ධනය විය. කෘෂිකාර්මික අපනයන අතුරින් කුළුබඩු අපනයන ආදායම පසුගිය වසරේ මැයි මාසයේ සිට අඛණ්ඩව ඉහළයාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී 2013 පෙබරවාරි මාසයේ දී තවදුරටත් වර්ධනයක් වාර්තා කරන ලදී.

2013 පෙබරවාරි මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 1,433 දක්වා සියයට 9.3 කින් පහත වැටුණි. 2013 පෙබරවාරි මාසයේ දී පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, තිරිඟු, රථ වාහන මෙන්ම කිරි හා කිරි නිෂ්පාදිත ආනයන වියදම අඩුවීම ආනයන වියදම පහත වැටීමට සැලකිය යුතු දායකත්වයක් ලැබිණි. එසේ වුවත්, 2013 පෙබරවාරි මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රත්රන්, ඛනිජ නිෂ්පාදිත, දියමන්ති හා වටිනා හා අර්ධ වටිනා ගල් වර්ග ආදී අන්තර් භාණ්ඩ

ආනයන වියදම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය විය. ඉදිරි මාසවලදී රෙදිපිළි නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යාමේ හැකියාවක් පිළිබිඹු කරමින්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වටිනාකම පසුගිය වසරට සාපේක්ෂව සියයට 18.3 කින් වර්ධනය විය. එසේම, 2013 පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව අඩු වූ අතර, ප්‍රවාහන උපකරණ ආනයනය අඩුවීම මේ සඳහා හේතු විය. එසේ වුවද, ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ කාණ්ඩයන්ගේ ආනයන වියදම 2013 පෙබරවාරි මාසයේ දී ඉහළ යන ලදී. පාරිභෝගික භාණ්ඩ ආනයනය සැලකීමේ දී ආහාර හා පාන මෙන්ම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. රථවාහන ආනයන පසුගිය වසරට සාපේක්ෂව සියයට 41.4 කින් අඩු වූ අතර එය පාරිභෝගික භාණ්ඩ ආනයනයේ සිදු වූ පහත වැටීමට විශාලතම දායකත්වයක් ලබාදෙන ලදී.

අපනයන සහ ආනයන ආශ්‍රිතව ඉහත පෙන්වා දුන් සංවර්ධනයන්ට අනුව 2013 පළමු මාස දෙක තුළ දී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 1,424 ක් දක්වා සියයට 20.3 කින් අඩු විය. පුළුල්වන වෙළෙඳ හිඟය සීමාකිරීම සඳහා 2012 පළමු භාගයේ දී ක්‍රියාවට නැංවූ බහුවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් ජංගම ගිණුමේ හිඟය අඩු කිරීම සඳහා තවදුරටත් උපකාරී විය.




2013 වසරේ පෙබරවාරි මාසයේ සංචාරක පැමිණීම් 2012 වසරේ අනුරූප මාසය සමග සැසඳීමේ දී 93,232 ක් දක්වා සියයට 11.6 කින් ඉහළ ගිය අතර, සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 103 ක් දක්වා සියයට 20.7 ක හිතකර වර්ධනයක් පෙන්වීය. 2013 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 4.2 ක වර්ධනයක් පෙන්නුම් කරමින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 490 ක් ලෙස වාර්තා විය. 2012 වසරේ පෙබරවාරි මාසයේ දී මෙය එ.ජ.ඩොලර් මිලියන 470 ක් විය.

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජකයන්ගේ ශුද්ධ විදේශ ලැබීම් 2012 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 16.3 හා සැසඳීමේ දී, 2013 පෙබරවාරි මාසයේ දී ශුද්ධ විදේශ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 8.7 ක් වාර්තා විය. මේ

අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. 2012 වසරේ පෙබරවාරි මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 229 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2013 වසරේ පෙබරවාරි මාසයේ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සඳහා එ.ජ.ඩොලර් මිලියන 212 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. 2012 පෙබරවාරි මාසය අවසානය වන විට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සඳහා සමුච්චිත ශුද්ධ ලැබීම් ලෙස වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 400 සමග සැසඳීමේ දී 2013 පෙබරවාරි මාසය අවසානය වන විට එ.ජ.ඩොලර් මිලියන 501 ක් වාර්තා විය. මීට අමතරව, 2013 වසරේ පෙබරවාරි මාසයේ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 132 ක් වූ අතර, 2012 පෙබරවාරි මස අවසානය වන විට සමුච්චිත දිගුකාලීන ණය ලෙස රජයට ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 240 සමග සැසඳීමේ දී 2013 පෙබරවාරි මස අවසානය වන විට එ.ජ.ඩොලර් මිලියන 278 ක් ලැබුණි.

2013 වසරේ ජනවාරි මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,670 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය 2013 වසරේ පෙබරවාරි මාසය අවසාන වන විට එ.ජ.ඩොලර් මිලියන 8,144 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2013 වසරේ පෙබරවාරි මස අවසාන වන විට දී පැවැති දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙළින් ආනයනික මාස 4.3 කට සහ 5.3 කට සමාන විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - පෙබරවාරි 2013 (අ)

| කාණ්ඩය | 2012 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | 2013 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | පෙබරවාරි වර්ධනය (සියයට) | 2012 ජන. සිට පෙබ. එ.ජ.ඩො. මිලියන | 2013 ජන. සිට පෙබ. එ.ජ.ඩො. මිලියන | ජන. සිට පෙබ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **821.0** | **797.5** | **-2.9** | **1,709.2** | **1,526.2** | **-10.7** |
| *මෙයින්,* | | | | | | |
| කෘෂිකාර්මික | **185.3** | **174.5** | **-5.9** | **366.8** | **341.5** | **-6.9** |
| *මෙයින්,* තේ | 105.1 | 103.4 | -1.6 | 209.0 | 204.5 | -2.2 |
| කාර්මික | **630.5** | **620.8** | **-1.5** | **1,333.5** | **1,180.5** | **-11.5** |
| *මෙයින්,* | | | | | | |
| රෙදිපිළි හා ඇඟළුම් | 341.5 | 371.6 | 8.8 | 708.0 | 705.5 | -0.4 |
| රබර් නිෂ්පාදිත | 75.2 | 66.1 | -12.1 | 153.4 | 128.8 | -16.0 |
| ආහාර, පාන හා දුම්කොළ | 22.8 | 16.1 | -29.5 | 43.6 | 28.5 | -34.6 |
| ඛනිජ ද්‍රව්‍ය | **4.1** | **1.4** | **-67.1** | **6.7** | **2.4** | **-64.5** |
| ආනයන | **1,580.7** | **1,433.2** | **-9.3** | **3,495.7** | **2,950.5** | **-15.6** |
| *මෙයින්,* | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | **251.0** | **208.7** | **-16.9** | **538.7** | **455.5** | **-15.4** |
| *මෙයින්,* ආහාර හා පාන වර්ග | 111.4 | 93.7 | -15.9 | 235.8 | 208.0 | -11.8 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 139.6 | 115.0 | -17.6 | 302.8 | 247.6 | -18.3 |
| අන්තර් භාණ්ඩ | **947.4** | **868.4** | **-8.3** | **2,043.9** | **1,698.1** | **-16.9** |
| *මෙයින්,* ඉන්ධන | 505.6 | 418.5 | -17.2 | 1,020.7 | 698.3 | -31.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 137.8 | 163.0 | 18.3 | 340.8 | 366.1 | 7.4 |
| ආයෝජන භාණ්ඩ | **379.7** | **355.6** | **-6.3** | **903.0** | **795.8** | **-11.9** |
| *මෙයින්,* යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 161.6 | 166.5 | 3.1 | 411.9 | 416.7 | 1.2 |
| ප්‍රවාහන උපකරණ | 117.2 | 84.2 | -28.2 | 261.9 | 136.9 | -47.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 100.6 | 104.6 | 4.0 | 228.3 | 241.5 | 5.8 |
| වෙළෙඳ ශේෂය | **-759.7** | **-635.7** | **-16.3** | **-1,786.5** | **-1,424.3** | **-20.3** |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | **470.4** | **490.0** | **4.2** | **943.1** | **1,014.1** | **7.5** |
| විවිධ ආයෝජන (ශුද්ධ) | **16.3** | **8.7** | | **20.4** | **-1.7** | |
| සංචාරක ඉපැයීම් | **84.9** | **102.6** | **20.7** | **173.8** | **209.7** | **20.6** |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ) | **532.6** | **699.4** | **31.3** | **858.3** | **1,522.5** | **77.4** |
| මෙයින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 385.0 | 567.6 | 47.5 | 614.6 | 1,243.9 | 102.4 |
| දිගු කාලීන ණය | 143.8 | 131.8 | -8.3 | 239.5 | 278.1 | 16.1 |

(අ) තාවකාලික

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.